යුවතිය ම, නැතහොත් නොවෙනස්ව ඒ අරමුණෝ අයිතිය සුරක්ෂිත කරගෙන සිටින යුවතිය ම අද දින ඒ ප්‍රශ්නය මගෙන් අසන්නේ ය. අප දෙදෙනා ගමන් ගන්නේ රේල් පීලි දෙකක් මත යැයි මට සිතිනි. අපේ ගමන එකිනෙකාට සමාන්තරව එකම දිශාවකට යොමුවී තිබිණි. නමුත් අනන්තයක් දුරක දී වත් එහි එක්වීමක් සිදුනොවනු ඇත.

"ලහිරු... මට අයිති නැති දෙයක් අහනව නම් මට සමාවෙන්න... " මොහොතකට ඇය සිතිවිල්ලේ පසුවිය.
"ඔයා... ඉස්සරහට මොකක් කරන්න ද හිතන් ඉන්නෙ...ලහිරු... ?"

"එන හැටියකට යමක් කරනව ටාන්‍යා... "

ඉදිරිපස වූ ඉහිරීයන වතුර මලෙන් විහිදියන සියුම් සිසිලසක් වරින් වර සුළං කපාගෙන අප වෙතට ඇදී ඒ. රන්වන් හිරුරැසින් දිලිසෙන දිය බිඳිති විනිවිදව තැපැල් කාර්යාලය ඇතුලටත් පිටතටත් නොකඩවා ගමන්ගන්නා මිනිස්රූප පෙළ පෙනෙන්නේ ඒ රූප තුල අපූර්ව සුන්දරත්වයක රටා මවමිනි. මම නොකඩවාම කතාකලෙමි.
"අපි කොහේ හිටියත් කරන්නෙ ජීවත් වෙන එකයි ටාන්‍ය... මගේ ජීවත්වීමේ අරමුණ නිසා අනුන්නට කරදරයක් වෙන්නෙ නැතිනම්... කොහේ... කොයි විදිහට ජීවත් වුණාත් මට එකයි..."

"මට ඔයාව තේරුම් ගන්න පුළුවන් ලහිරු..."

එසේ කියමින් ඇය සිය ඇඟිලි තුඩු මගේ බාහුව මත තිබුවේ සීරුවෙනි. එසේ තබා ඒ මොහොතේ ම ඇය ඒ ඇඟිලි තුඩු ඉවතට ඇද ගත්තා ය. නමුත් ඒ නිමේශය මගේ හදවතේ ඇතිකර ලීමට සමත්වූ ඒ කම්පනය ජීවිතය පුරා ම මා සමඟ රැඳෙන මතකයේ සුවඳක් බව මම දැනගෙන සිටියෙමි. ඇගේ නිහඬ දෙනෙත ද ඒ වනවිට කඳුලින් පිරී තිබෙනවා මම දුටුවෙමි.

"ලහිරු..." ඇය නැවත යථාතත්වයට පත්ව ඇත.

"ඇයි ටාන්‍ය..."

"හෙට උදේ මම ඔයාව ලස්සන ගමනක් එක්කගෙන යනව..."

"ඒ කොහෙට ද?"

"ඔයා ආස කරයි කියල හිතෙන තැනකට... ජානකියි තව යාළුවො කිහිප දෙනෙකුයි අපිත් එක්ක එනව හෙට..."
"ජානකී....?" මම පුදුම වීමි. මම පර්ත් පැමිණි පසු වරක් දෙවරක් පීටර් අන්කල්ට දුරකතනයෙන් කතාකලද මෙවර මට ඔවුන් කිසිවෙක්ම තවමත් මුණගැසී තිබුනේ නැත.
"ඔව්... ඒ ගමන යාළුවොත් එක්ක යන එක තනියම යනවට වඩා ලස්සනයි ... වෙන මොනවත් ඕනැ නැහැ ඔයා අමතර ඇඳුමක් විතරක් ගේන්න..."
"ඔයා කොහොමද ටාන්‍ය ජානකීව හඳුනන්නෙ...?" මම ගමනේ විස්තර වලට වඩා පුදුම වීමට බලා සිටියේ ජානකීගේ දැන හැඳුනුම්කම් පිළිබඳවය.
"මම ජානකීව දන්නෙ කොහොමද කියන එක ඔයාට හෙට දැනගන්න ලැබෙයි. ඇත්තෙන්ම මේ ගමනත් එයාල ලැහැස්ති කල එකක්....මම ඔයත් එක්ක ඒ ගමනට සහභාගිවෙනව විතරයි...."
මම ඉන් එහා කිසිවක් ඇගෙන් ඇසීමට ගියේ නැත. හැරත් සිදුවන කිසිවකට මුහුණදෙනවා හෝ දැනගන්නට ලැබෙන සියල්ල අසා සිටිනවා මිස පුදුමවීම සඳහා කිසිවක් මගේ ජීවිතයේ තවත් ඉදිරියට ඉතිරිව නැත යැයි මම සිතමි.

පසුව දා අප ගිය ගමන පෙන්ගුයින් දූපතට ය. රොකින්හැම්වල පිහිටි එක්තරා තුඩුවක් අසලට දක්වා වාහනවලින් ගිය අපි එතැන සිට මුහුදු තීරුව හරහා පයින් දූපතට ඇවිද ගියෙමු. ගැඹුරුම තැන අපි

සිදුවීමට මුහුණ දෙන කෙනා හරි වටේට ඉන්න අය හරි නොදැන ගත්තත් සිදුවිය යුතුදේ සිදුවිය යුතුමයි ලහිරු අයිය..... එහෙම නොවෙනවනම් මේ ලෝකෙ උත්තරීතරයි කියල කියන බොහෙ-ාමයක් දේවල්, වටිනාකම නැත්තටම නැති දේවල් වෙනව..

පසු කරන විට වතුර තිබුණේ මගේ ඉණ දක්වා ය. ටාන්‍ය කිව්වාක් මෙන් ඒ ගමනේ සුන්දරත්වය පිරිසක් සමඟ සිටින විට වාඩාත් දැනෙන්නට විය. ටාන්‍යාගේ ශ්‍රද්ධාති සොහායුරියක් ජානකිගේ යොහළියක් විය. ජානකීගේ යහළු යෙහෙළියන් අතර හැම ජාතියකට ම අයත් වූවන් සිටියා යැයි මට සිතිනි. ඒ ගමන ටාන්‍යා මුල්කර තිබූවක් බව මට හැඟීගියද එය කුමන කරුණක් අරභයාද යැයි වැටහීමක් මාවෙත නොවුනි. ගමනේ අතරමැද බොහෝ අවස්ථාවලදී ජානකී සිටියේ මා අසල දැවටමෙනි. ඇය මා සමඟ කතාවට වැටුනේ වෙරළතීරුව දිගේ ඇවිදිමින් සිටි මොහොතකය. කුඩා ගල් කඳු නගිමින් බහිමින්ද, නැවත මුහුදු දියේ දෙපා තෙමමින්ද, පිරිසෙන් ඈත්වී මා සිටියේ සියුම් අතීතාවර්ජනයකය යෙදෙමිනි.

"ලහිරු අයිය..."
"මොකද....?"
"මම ආවෙ ඔයාට සුභපතන්න... "
"මොකක් ගැනද....?"
"මොකක් වෙනුවෙන්ද කියල .... හරියටම කියන්න මම දන්නෙ නැහැ..."
"නොදන්න දෙයක් ගැන කොහොමද සුභපතන්නෙ....?"

"සිදුවීමට මුහුණ දෙන කෙනා හරි වටේට ඉන්න අය හරි නොදැන ගත්තත් සිදුවිය යුතුදේ සිදුවිය යුතුමයි ලහිරු අයිය..... එහෙම නොවෙනවනම් මේ ලෝකෙ උත්තරීතරයි කියල කියන බොහොමයක් දේවල්, වටිනාකම නැත්තටම නැති දේවල් වෙනව..."
"නෑ නංගි... ඒ දේවල් වලට ඒ තරම්ම වටිනාකමක් ඇතිවෙලා තියෙන්නෙ, ඒ වටිනාකම නොනැසී පවතින්නෙ ඒව සදාකාලිකවම ඉටුනොවන දේවල් හැටියට තියනකම් විතරයි...."
ජානකී සිටියේ මට පිටුපසිනි. ඇගෙන් පිළිතුරක් නොවූයෙන් මම ආපසු හැරී බැලුවෙමි. ඇය ආපසු හැරී මට පිටුපා වතුරේ ප්‍රමාදවන්නට විය.
"ජානකී මේ මොකද ....?"
"ඇයි ඔයා ඔය තරමටම නපුරු ලහිරු අයිය ...?"
"දැන් ඉතින් අඬන්න හරි, එහෙම නැත්නම් මාත් එක්ක තරහ වෙන්න හරිද ලැහැස්තිය....?" කිසිවක්ම නොකියූ ඇය සිනාසුනි. මම හිතාමතාම කතාව වෙනතකට යොමු කලෙමි. මෙලොව කිසි-වෙක්ම කිසිම දිනෙක මා තේරුම් නොගනු ඇත. කාලයට පමණක් ඉඩදී සියල්ල සිදුවෙනතුරු මම බලානොසිටිමි. නමුත් හිමිවන ආදරයක් මිස ඉල්ලා සිටින ආදරයක් තුල සිට කිසිදිනෙක මට මා දැකිය නොහැකිබව පමණක් මම දැනසිටින්නෙමි. ලෝකයේ ප්‍රායෝගික සියල්ලමත් උඩු යටිකුරු කලද මිනිසෙකු නිමවා ඇති පෞද්ගලික සැකිල්ල කිසිම දිනෙක වෙනස්කල හැකි වේද....?

ආපසු එන ගමනේදී මම ටාන්‍යාට ස්තුතිවන්ත වීමි.
"හරිම ලස්සන ගමනක් මේක ටාන්‍යා... ඔයාට ස්තුතියි මාව එක්කන් ආවට... මම මේ ගැන අහල තිබුණට එන්න අවස්ථාවක් ලැබිල තිබුණෙ නැහැ..."
"මම දැනගෙන හිටිය ඔයා කැමති වෙන බව..."
"අර ඈතට වෙන්න තියෙන්නෙ රොටනස් දූපත නේද? මහේලයි අපි කට්ටියකුයි ඒකට නම් ගියා දවසක..."
මා කියූ දෑ වැරැදි දැයි මට මොහොතකින් සිතුනේ ඉන් ටාන්‍යාගේ ඉරියව්

සම්පූර්ණයෙන් ම වෙනස් වූ බැවිනි. ඉන්පසු ගෙදරට එන තුරුත් අපි විශේෂ යමක් කතා නොකළෙමු. කෙලින් ම නවාතැනට මා කැඳවාගෙන යනවා වෙනුවට ටාන්‍යා මුහුදු තීරුව දිගේ ඇති මාර්ගය ඔස්සේ උතුරු දෙසට වාහනය දිගට ම පවදාගෙන ගියාය. මේ මාර්ගය දිගේ ඇගේ නිවස ඉදිරිපස දක්වා ම යා හැකි බව මම දැන සිටියෙමි. අපි යන්නේ ඇගේ ගෙදරට ද කියා ප්‍රශ්න කිරීමට වත්, ඒ වෙනුවෙන් මගේ කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ කර සිටීමට වත් මා උනන්දු වූයේ නැත. ඇගේ නිවස පෙනෙන තෙක් මානයේ දුරකට පැමිණි පසු වෙරළ පැත්තට වන්න පාර අයිනේ ඇය වාහනය නැවත්වීය.
"අද විශේෂ දවසක් ලහිරු... ඔයාට විශේෂ තැනක් පෙන්නන්නයි මම එක්කගෙන ආවෙ..."

"විශේෂ තැනක්..." අපි වාහනයෙන් පිටතට පැමිනියෙමු.

"ඔව්... අපේ පවුලෙ අය විතරක් දන්න තැනක්..."

ඇය සිටියේ වෙරළ සීමාවේ සිට මුහුද දෙසට ඇවිදගෙන යමිනි. මේ හරියේ පොළව මට්ටම මුහුදු මට්ටමට වඩා අඩි ගණනාවක් ම උස් බව මට වැටහී තිබිණි. හිටිහැටියේ ම නැවතුන ඈ ගමන් කරමින් සිටි දිශාව වෙනස් කරමින් ගල් අතරින් පොළොවේ බෑවුම දිගේ පහළට බැසීමට පටන් ගති. අඩි දහයක් පහළොවක් පමණ බෑවුම් සහිත වලකට බැස්ස පසු ඉතා සුවපහසු පැතලි ගලක් මත ඈ අසුන් ගත්තාය. මුහුදේ ගෝසාවත් කුරුල්ලන්ගේ හඬත් නොවේ නම් අප ඒ සිටින්නේ වනන්තරයක් මැද යැයි හැඟී යන පරිදි ඝන වන වදුලක් වලතුළ සිට පොළොව මතු පිටට පැතිරී පැවතිනි. වළාකුලින් පිරුණු නිල් අහස අප දුටුවේ ද ගස් අතු අතරිනි.

ඇත්තෙන් ම පුදුම විය හැකි සුන්දරත්වයක් මම ඒ වල තුළ දුටුවෙමි. අපි හිඳගෙන සිටි ගල, පතුලේ එක් පැත්තකින් පමණක් වලට සම්බන්දවී තිබූ අතර ඒ නිසා ගල පතුලින් වරින්වර මුහුදු රළ අපේ දෙපා තෙත් කරමින් ඇතුළට කාන්දු විය. රළ ගලාවිත් මොහොතකට පමණක් කුඩා පොකුණක අසිරිය ගන්නා වල පතුල, නැවත තෙත සිඳීගොස් මිනිස් පිය සටහනක් නොලැබූ වෙරළ කොටසක සිරි උසුලයි. වැලිකැට අතරින් තැනින් තැන ඉලිප්පී පෙනෙන සිප්පිකටු කුඩාකල මා දුටු පියකරු වෙරළක සිතුවමක් සිත මවාලයි. කුඩා කලදී නම් මා මොහොතකින් පතුලට පැන සිප්පිකටු ඇහිඳීමටත්, ඇතුලට රළ ගලා එන මොහොතක උඩ පනිමින් ඇඟපුරාම තෙත වැලි තවරාගනිමින් හඬනගා සිනාසීමටත් සිතනවා විය යුතුය. නමුත් මම දැන් මුහුකුරාගිය තැනැත්තෙක් වෙමි. එවැනි ක්‍රියාවකින් කුඩාකල ලැබූ පමණම ප්‍රීතියක් මට අදද ලැබිය හැකි වෙතත්, එවැන්නකට සිත පොළඹවාලීමට තරම් නොවන ආකාරයේ වගකීම් සහ ගැටලු රැසකින් ඒ ආදරණීය ළමා මනස කනගාටුදායක ලෙසට මගේ හදවතින් අද පන්නාදමා ඇත.......

"ලස්සනයි නේද තැන ලහිරු...?"

ඒ බොළඳ ළමාවිය ඉක්මවා සිටියද තවමත් මම ජීවිතයේ සුන්දරත්වය දකින්නෙමි. එක අතකට ඒ කුඩාකල පමාවීමට නොහැකි තරම් වේගයකින් එළඹිය යුතුයැයි බලාසි-ටියේ ද මේ සුන්දර වූ යෞවනයම නො-වේද........?

"හරිම ලස්සනයි ටාන්‍ය..."

"ලහිරු ඔයාට දෙයක් කියන්න තියෙනව මට..." ඈ මොහොතකින් ගැඹුරු යමකට මුලපුරනවා මට දැනිනි.

"ඒ මොකක් ද.... ?"
"ඔයාට මම දවසක් කිව්ව මතකද මම කරන්න ඕනැ දේ තීරණය කරලයි තියෙන්නෙ කියල..."
"ඔව්..."
"ඒ තීරණය වෙනුවෙන් මම හෙට පිටත්වෙලා යනව ලහිරු..."

ලබන කලාපයට

TAX RETURNS
2006

Now taking appointments for 2006 year

DON'T DELAY
Ring now to book your appointment

03 - 9764 8955
0408 328 860
Email: smaya@tpg.com.au

Sumith Mayadunne MPA, BEcon

MAYADUNNE & ASSOCIATES
Registered Tax Agent & Accountant
ROWVILLE